# 2024-10-21 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

01. ශ්‍රී ලංකා - පාකිස්ථානු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සැමරීම වෙනුවෙන් සමරු මුද්දර නිකුත් කිරීම

ශ්‍රී ලංකාව සහ පාකිස්ථානු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ආරම්භ කර 2022 වර්ෂයට 75 වසරක් සපුරා ඇත. දෙරට අතර පවතින දීර්ඝකාලීන රාජ්‍ය තාන්ත්‍රික සබඳතාව සනිටුහන් කරමින් සමරු මුද්දර 02ක් නිකුත් කිරීමට දෙපාර්ශ්වය අතර එකඟතාවකට පැමිණ ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව සහ පාකිස්ථානු තැපැල් ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව - (CHOGM)

පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව 2024 ඔක්තෝබර් මස 24 දින සිට 26 දින දක්වා සැමෝවාහි අපියාහිදී "අභියෝගයන්ට මුහුණදිය හැකි අනාගතයක්: අර්ථකාරී පොදු රාජ්‍ය මණ්ඩලයක්" යන තේමාව යටතේ පැවැත්වීමට නියමිතව ඇත. ඒ සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ ලන්ඩනයේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විත නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි කරවීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

03. **බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මහානායක වාරිකාරාමයේ ප්‍රතිසංස්කරණ කටයුතු**

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 07, විජේරාම මාවතෙහි පිහිටි වාරිකාරාම ගොඩනැගිල්ල මහානායක ස්වාමීන් වහන්සේලා කොළඹට වැඩම කරන අවස්ථාවලදී නවාතැන් පහසුකම් සලසා ගැනීම සඳහා භාවිත කරනු ලබයි. මෙම ආරාමයේ පොදු පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නාවික හමුදා ශ්‍රම දායකත්වය යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු 2021 වර්ෂයේ ආරම්භ කර ඇත. වෙළෙඳපොළ තුළ අමුද්‍රව්‍ය මිල ඉහළ යාම සහ හඳුනාගත් අමතර කාර්යයන් ඇතුළත් කිරීමට සිදුවීම හේතුවෙන් ආරම්භක පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කළ යුතුව තිබේ. ඒ අනුව, අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වන ඇස්තමේන්තුව රුපියල් මිලියන 86.97ක් ලෙස සංශෝධනය කිරීමටත්, 2024 වර්ෂය සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන රුපියල් මිලියන 31.86ක් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීම පිණිසත් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින අබලි ලෝහ බැහැර කිරීම**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂිකව අබලි ලෝහ විශාල ප්‍රමාණයක් එකතු වන අතර, දැනට එකතු වී පවතින අබලි ලෝහ තොගය ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් බැහැර කිරීම සඳහා 2024-06-11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එහෙත්, දේශීය කර්මාන්තකරුවන්ගේ අමුද්‍රව්‍ය හිඟය සඳහා විසඳුමක් ලෙස ඔවුන්ට ද තරගකාරී පදනම මත මිල ගණන් ඉදිරිපත් කර අබලි ලෝහ ද්‍රව්‍ය මිල දී ගැනීමට හැකි වන පරිදි ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම යෝග්‍ය බවට හඳුනාගෙන තිබේ.

ඒ අනුව කටයුතු කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **නැගෙනහිර බහළු පර්යන්ත ව්‍යාපෘතිය විශේෂිත ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කොළඹ දකුණු වරාය ව්‍යාපෘතියේ නැගෙනහිර බහළු පර්යන්තය අදියර වශයෙන් සංවර්ධනය කර එම අධිකාරියේ පූර්ණ හිමිකාරිත්වය සහිත බහළු පර්යන්තයක් වශයෙන් ක්‍රියාත්මක කිරීම පිණිස 2021-02-01 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අදාළ සිවිල් වැඩ සඳහා වන කොන්ත්‍රාත්තුව මේ වන විට පිරිනමා ඇති අතර, ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී. එසේම, එකී බහළු පර්යන්තය සඳහා අවශ්‍ය දොඹකර මිල දී ගැනීමේ ප්‍රසම්පාදනය ද මේ වන විට පිරිනමා තිබේ. කොළඹ වරායේ පුද්ගලික පර්යන්ත මෙහෙයුම්කරුවන් සහ සේවා සැපයුම්කරුවන් හට උපායමාර්ගික සංවර්ධන පනත සහ ආයෝජන මණ්ඩල නීතිය යටතේ විවිධ බදු සහන ලබා දී ඇත. එම කරුණු ද සැලකිල්ලට ගනිමින් නැගෙනහිර බහළු පර්යන්ත ව්‍යාපෘතිය "විශේෂිත ව්‍යාපෘතියක්" වශයෙන් මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **මෙහෙයුම් නිරුපද්‍රිතතාව සහ ගුවන් යෝග්‍යතාව අඛණ්ඩව පවත්වා ගැනීමේ සහයෝගිතා සංවර්ධන වැඩසටහන**

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ අනුග්‍රාහකත්වය යටතේ බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන දකුණු ආසියානු රටවල සහයෝගිතාවයෙන් "මෙහෙයුම් නිරුපද්‍රිතතාව සහ ගුවන් යෝග්‍යතාව අඛණ්ඩව පවත්වා ගැනීමේ සහයෝගිතා සංවර්ධන වැඩසටහන - දකුණු

ආසියාව" 1997 වර්ෂයේදී ආරම්භ කර ඇත. අදාළ රාජ්‍යයන් විසින් එකී වැඩසටහන සඳහා වාර්ෂිකව පිරිවැය දායකත්වය ලබා දිය යුතු අතර මේ වන විට ශ්‍රී ලංකාව අදියර V දක්වා වන දායක මුදල් ගෙවනු ලැබ තිබේ. එම වැඩසටහනේ අදියර VI යටතේ අරමුණු 08ක් සාක්ෂාත් කර ගැනීම පිණිස වසර 05ක කාලසීමාවක් දක්වා වන වැඩපිළිවෙලක් සැලසුම් කර ඇත. ඒ අනුව, එකී වැඩසටහනෙහි ඉදිරි වර්ෂ 05 සඳහා ඇමෙරිකානු ඩොලර් 95,848ක් බැගින් වාර්ෂික දායක මුදල් ගෙවීමටත්, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය වෙත අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය සහාය ලබා දීමටත් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **ශ්‍රී ලංකා පොලීසිය සතු මිරිහාන, කිකිළියාමාණ සහ වව්නියාව සන්නිවේදන කුලුනු අලුත්වැඩියා කිරීම**

ශ්‍රී ලංකා පොලීසියේ සන්නිවේදන ජාලය පවත්වාගෙන යාම සඳහා දිවයිනේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි සන්නිවේදන කුලුනු ස්ථාපිත කරනු ලැබ ඇත. ඒ අතුරින් මිරිහාන, කිකිළියාමාණ සහ වව්නියාව යන සන්නිවේදන කුලුනු කඩිනමින් අලුත්වැඩියා කළ යුතුව තිබේ. ඒ අනුව, මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, 2024-2026 මධ්‍යකාලීන අයවැය රාමුව තුළ අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගනිමින් අදාළ සන්නිවේදන කුලුනු අලුත්වැඩියා කිරීම සඳහා වන උපදේශක සේවා කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පිරිනැමීමටත්, එකී සන්නිවේදන කුලුනු අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව විවෘත තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් තෝරාගනු ලබන ආයතනයක් වෙත පිරිනැමීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. අම්පාර එක්ගල්ඔය සංචාරක බංගලාව සහ රිවස්ටන් සංචාරක බංගලාව (දුම්බර වන නිවහන) නවීකරණය කිරීම

රජයේ ආයතන සතු නිවාඩු නිකේතන හා සංචාරක බංගලා උපරිම ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් නිර්දේශ කිරීම පිණිස පත් කරන ලද කමිටුවේ නිර්දේශ මත නවීකරණය කළ යුතු සංචාරක බංගලා 09ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හඳුනාගනු ලැබ තිබේ. ඒ සඳහා රුපියල් මිලියන 166.93ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ලැබී ඇති අතර, එම ව්‍යාපෘති මෙම වසර තුළ දීම නිම කළ යුතුව ඇත. ඒ අනුව, එක්ගල්ඔය සහ රිවස්ටන් සංචාරක බංගලා නවීකරණ කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ අධීක්ෂණය යටතේ මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම මඟින් ඉටු කරවා ගැනීම පිණිස පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම

ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කරමින් සිටි රියර් අද්මිරාල් පී.විතාන මහතා වයස අවුරුදු 55 සම්පූර්ණ වීම මත 2024-09-13 දින විශ්‍රාම ලබා ඇත. ඒ අනුව පුරප්පාඩු වී ඇති එකී තනතුරට දැනට වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරනු ලබන රියර් අද්මිරාල් වයි.ආර්.සේරසිංහ මහතා පත් කිරීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **මහා භාණ්ඩාගාරයේ ඉහළ කළමනාකාරිත්වය සඳහා නිලධාරීන් පත් කිරීම**

මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාවකට අනුව පහත සඳහන් පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

* දැනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි එච්.සී.ඩී.එල්.සිල්වා මහතා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු වශයෙන් පත් කිරීම.

* දැනට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු ලෙස සේවය කරනු ලබන ආර්.එම්.පී.රත්නායක මහතා 2024-11-06 දින විශ්‍රාම ලැබීමෙන් අනතුරුව පුරප්පාඩු වන එම තනතුර සඳහා දැනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ඩී.ඒ.පී.අබේසේකර මහතා පත් කිරීම.

* එච්.සී.ඩී.එල්.සිල්වා මහතා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු වශයෙන් පත් කිරීම හේතුවෙන් පුරප්පාඩු වන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා දැනට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරනු ලබන ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ඒ.එන්.හපුගල මහතා පත් කිරීම.

* දැනට ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරනු ලබන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි එන්.එස්.එම්.පී.රංජිත් මහතා එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කිරීම.

* දැනට පුරප්පාඩුව පවතින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කරනු ලබන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනි ජේ.එම්.එස්.ඩී.රත්නායක මහත්මිය පත් කිරීම.

**11. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ආචාර්ය ටී.එම්.ජේ.නිලාන් කුරේ මහතා පත් කිරීම**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කළ මහාචාර්ය ගාමිණී රණසිංහ මහතා ඉල්ලා අස්වීම හේතුවෙන් මේ වන විට එම තනතුර පුරප්පාඩුව පවතී. දේශීය මෙන්ම විදේශීය පුරාවිද්‍යා, වාස්තු විද්‍යා, පුරාවිද්‍යා සංරක්ෂණ ක්ෂේත්‍රයන්හි පුහුණු හා අත්දැකීම් සහිත, ප්‍රකාශන ව්‍යාපෘති හා ශාස්ත්‍රීය පර්යේෂණ රාශියකට නායකත්වය හා මාර්ගෝපදේශකත්වය ලබා දී ඇති ආචාර්ය ටී.එම්.ජේ.නිලාන් කුරේ මහතා එම තනතුර සඳහා සුදුසු බවට හඳුනාගෙන තිබේ. ඒ අනුව, ඒ මහතා මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම**

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව එම කොමිෂන් සභාව සාමාජිකයින් 8 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වේ. එකී පනතේ 3(1)(අ) වගන්තිය අනුව ඉන් තිදෙනෙකු ප්‍රවාහන, ප්‍රතිපත්ති සැලසුම් හා මුදල් යන විෂයභාර අමාත්‍යාංශ නියෝජනය කරමින් නිල බලයෙන් පත් කරනු ලබයි. එම පනතේ 3(1)(ආ) වගන්තියේ නිර්ණායකයන්ට යටත්ව, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව ප්‍රවාහන විෂයභාර අමාත්‍යවරයා විසින් සාමාජිකයින් පස්දෙනෙකු පත් කළ යුතුව ඇති අතර, ඔවුන්ගේ ධූර කාලය වසර 03ක් වේ. එසේම, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ විධිවිධාන පරිදි කොමිෂන් සභා සාමාජිකයින් අතුරින් විෂයභාර අමාත්‍යවරයා විසින් සභාපතිවරයා පත් කරනු ලැබිය යුතුය. ඒ අනුව, පනතේ 3(1)(ආ) වගන්තියේ විධිවිධාන පරිදි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් තැනැත්තන් හතරදෙනා පත් කිරීමටත්, ඒ අතුරින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති ලෙස ආචාර්ය බන්දුර දිලීප විතාරණ මහතා පත් කිරීමටත් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* ආචාර්ය බන්දුර දිලීප විතාරණ මහතා - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
* ඩබ්ලිව්.රවී ප්‍රසාද් ද මෙල් මහතා - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
* ආචාර්ය නාමලි තරංගා සිරිසෝම මහත්මිය - ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
* ඒ.අයි.යූ.පෙරේරා මහතා - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස්

13. **අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමේ සීමාවන් ප්‍රතිශෝධනය කිරීම**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන වැටලීම් සඳහා මුදල් ලබා දීම පිණිස වැටලීම් අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යනු ලබන අතර, එම අත්තිකාරම් ගිණුමේ උපරිම වියදම් සීමාව රුපියල් මිලියන 50කි. අල්ලස් වශයෙන් ලබා දෙන මුදල නිශ්චිතව තීරණය කළ නොහැකි බැවින් සහ දැනට ලැබෙන අල්ලස් පැමිණිලිවල ස්වභාවය අනුව අල්ලස් අයදින මුදල ඉතා ඉහළ අගයක් ගනු ලබන බැවින් අදාළ උපරිම වියදම් සීමාව කඩිනමින් සංශෝධනය කළ යුතුව ඇත. ඒ අනුව, අල්ලස් වැටලීම් අත්තිකාරම් ගිණුමේ උපරිම වියදම් සීමාව රුපියල් මිලියන 150 දක්වා වැඩි කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කරනු ලබන මහා පරිමාණ ව්‍යාපෘති සඳහා සුළු වියදම් මූල්‍යනය පහසුකම හරහා අරමුදල් සලසා ගැනීම**

ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුද සන්දර්භය සැලකිල්ලට ගනිමින් මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීම හා පසු ඉදිකිරීම් කටයුතු සඳහා සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය අරමුණු කරගත් අනුපූරක ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම සඳහා සුළු වියදම් මූල්‍යනය පහසුකම් යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත්වලින් (නිත්‍ය) ඇමෙරිකානු ඩොලර් මිලියන 30ක් ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟතාව පළ කර ඇත. ඒ අනුව, එම ණය මුදල භාණ්ඩාගාර ඇපකර යටතේ වාරික 02කින් ඍජුවම ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා ගැනීම පිණිස බලශක්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********